## 251 සිහිල් සුළං රැලි

සිහිල් සුළං රැලි පාවෙන්නේ
කුරුළු හඬින් ගීත ඇසෙන්නේ
තුරු මත මල් කැකුළු දිලෙන්නේ
උදා ගිරෙන් හිරු පායන්නේ

සතුටු සිනාවෙන් මුව සරසාලා
සුහද කතාවෙන් සිත් සනසාලා
සැමටම සුබ සෙත සදන්න
අපට සරණ වන්නැ දෙවිඳුනේ //

සැමට දයාවෙන් අතහිත දීලා
මෙත් කරුණාවෙන් සැනසෙන ලීලා
නිරතුරු අප කල් ගෙවන්න
රට දියුණුව ඇති කරන්න
අපට සරණ වන්නැ දෙවිඳුනේ //

ඉගෙන ගැනීමෙන් නුවණ වඩාලා
ගුණමිනි බරණින් හැඩ වැඩ වීලා
ඉදිරියටම පිය නගන්න
අනාගතය සරු කරන්න
අපට සරණ වන්නැ දෙවිඳුනේ //